**ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2017**

ඔපෙක් අරමුදලින් කොළඹ ජාතික මහා මාර්ග පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහාවූ ඔපෙක් අරමුදල අතර 2013 ජූනි 10 දින එළඹි අංක 15111පීබී දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට මහා මාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහා මාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ තදාසන්න ප්‍රදේශවල ප්‍රධාන මහා මාර්ග කිලෝමීටර් 65.45 ක් වැඩිදියුණුකිරීම හා නාරාහේන්පිට නුගේගොඩ පාලම ප්‍රතිසංස්කරණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 12,347.37 කට සමාන එ.ජ.ඩො. මිලියන 94.99 ක් වන අතර ඉන් රු. මිලියන 6,499.57 කට සමාන එ.ජ.ඩො.මිලියන 50 ක් සැපයීමට ජාත්‍යන්තර සංවිධානය සඳහා වූ ඔපෙක් අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 දෙසැම්බර් 11 දින ආරම්භ කරන ලද අතර 2017 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිත විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය කාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයන්ගෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම්, ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

ගිණුම්කරණ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන සම්පූර්ණ කරන ලද සිවිල් කටයුතුවල සහ රඳවා තබාගත් මුදල්වල වටිනාකම රු.මිලියන 9.81 කින් සහ රු.මිලියන 11.54 කින් අඩුවෙන් දක්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන |
| ඔපෙක් ණය | 50.00 | 6,499.57 | 1,217 | 9.36 | 1,217 | 18.42 | 2,395 |
| ශ්‍රී.ලං.ර | 44.99 | 5,847.80 | 850 | 6.05 | 786 | 22.31 | 2,901 |
| **එකතුව** | **94.99** | **12,347.37** | **2,067** | **15.41** | **2,003** | **40.73** | **5,296** |

ඉහත දැක්වෙන තොරතුරු අනුව, අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක ලඟාකර ගැනීමට සමස්ත කාලපරිච්ඡේදයට ආවරණය වන පරිදි පරිපූර්ණ සමස්ථ සැලැස්මක් නොමැතිවීම හේතුවෙන් ණය මුදල් උපයෝජනය මන්දගාමීව පැවතුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

කොන්ත්‍රාත් පැකේජ 07 ක් යටතේ ක්‍රියාත්මක කොළඹ දිස්ත්‍රික්කයේ ජාතික මාර්ගවල කිලෝමීටර් 63.72 ක් හා නාරාහේන්පිට - නුගේගොඩ පාලම පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීමෙන් ව්‍යාපෘතියේ විෂය පථය සමන්විත වී තිබුණි. 2013 දෙසැම්බර් 11 දින මාර්ග පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට සැලස්ම් කර තිබුණි. කෙසේවෙතත් 2017 දෙසැම්බර් 31 දිනට පාලමේ වැඩිදියුණු කිරීමේ කටයුතු සහ මාර්ග 05 ක කිලෝමීටර් 12.77 ක පුනරුත්ථාපන කටයුතු අවසන් කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට කොට්ටාව - තලගල මාර්ගයේ, කෝට්ටේ - බෝපේ සහ ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගවල පුනරුත්ථාපන කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 32.89 ක්, සියයට 20.17 ක් සහ සියයට 15.06 ක ඉලක්කගත ප්‍රගතියට එරෙහිව පිළිවෙළින් සියයට 11.73 ක, සියයට 14.27 ක සහ සියයට 3.44 ක මන්දගාමී ප්‍රගතියක් දැක්විය.

අනෙකුත් මාර්ග 03 හි කිලෝමීටර් 15.06 ක පුනරුත්ථාපන කටයුතු 2018 දෙසැම්බර් 31 දින වන තෙක් ආරම්භ කර නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ කිලෝමීටර් 3.56 ක පුනරුත්ථාපනය යටතේ මාර්ග 04 කින් සමන්විත මීටර් 27 ක් දක්වා මාර්ගය පළල් කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, මාර්ගයේ දැනට පවතින පාලම අලුත්වැඩියාවට සහ පළල් කිරීමට පියවර ගෙන නොතිබීම නිසා මාර්ග තදබදයක් සහ අනාරක්ෂිත මාර්ග තත්ත්වයන් ඇතිවීමට හේතුවී තිබේ.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුම අනුව, අදාල කොන්ත්‍රාත්තුවේ පිරිවැයෙන් සියයට 3ක් ඉක්මවන අන්තර් ගෙවීම් සහතික ඇගයීම් ක්‍රියාවලට වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. කෙසේවෙතත්, කොට්ටාව - තලගල මාර්ගය, ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගය සහ කෝට්ටේ - බෝපේ මාර්ගවල පුනරුත්ථාපන කටයුතුවලට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් වටිනාකම්වලට වඩා අඩු අන්තර් ගෙවීම් සහතික සමඟ හිමිකම් ඉල්ලීම් 13 ක් ඉදිරිපත් කර තිබුණි.